මගේ අංකය : JSC/SEC/CIR-L/2024

මහාධිකරණ විනිශ්චයකාරවරුන් ඇතුළු සියලුම විනිශ්චයකාරවරුන් වෙත,

<u>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ප්‍රජා පොලිස්, සංචාරක, ආයෝජන හා මැතිවරණ - නීතිඥ අසංග කරවිට මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අංක **SDIG/ELE/PAR/OUT/282/24** හා **2024.10.28** දිනැති ලිපිය අවධානයට ලක් කිරීම</u>

*"2024 පාර්ලිමේන්තු මැතිවරණය හා සම්බන්ධ රාජකාරී සඳහා පොලිස් නිලධරයන් යෙදවීම හේතුකොට ගෙන දින කිහිපයක් ගරු අධිකරණයන් හී සාක්ෂි දීම / අනෙකුත් කටයුතු වෙනුවෙන් පොලිස් නිලධරයන් වෙත දින ලබා ගැනීම"* යන ශීර්ෂය යටතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ප්‍රජා පොලිස්, සංචාරක, ආයෝජන හා මැතිවරණ - නීතිඥ අසංග කරවිට මහතා විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අංක SDIG/ELE/OUT/893/24 හා 2024.10.28 දිනැති ලිපියක් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව එම ලිපිය සුදුසු කටයුතු සඳහා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ වෙබ් අඩවියේ පළ කොට ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව එම ලිපිය මේ සමඟ අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට සුදුසු කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

සී.එච්.පී. ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවට

සී.එච්.පී.ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 නොවැම්බර් මස 12 වැනි දින,

කොළඹ 12,

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.

දුරකථන
தொலைபேசி
Telephone

ජ්‍යෙ.නි.පො.ප - 071 - 8592641
කාර්යාලය - 011 - 2121537
පුද්ගලික සහකාර - 071 - 8597908

ෆැක්ස්
தொலைநகல்
Fax

විද්‍යුත් තැපෑල
மின்னஞ்சல்
E - Mail

sdig.cemt@police.gov.lk

මාගේ අංකය
எனது இல
My No
SDIG/ELE/PAR/OUT/28/24

ඔබේ අංකය
உங்கள் இல
You're No

දිනය
திகதி
Date
2024.10.29

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
ප්‍රජා පොලිස්,සංචාරක,ආයෝජන හා මැතිවරණ
අංක 140, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
சிரேஷ்ட பிரதிப் பொலிஸ் மா அதிபர்
பிரைஜைகள், சுற்றுலா, முதலீடு மற்றும் தேர்தல்கள்
இல 140 ஸ்ரீமத் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை, கொழும்பு 02
SENIOR DEPUTY INSPECTOR GENERAL OF POLICE
COMMUNITY POLICING, TOURIST, INVESTMENT & ELECTION
No. 140, Sir Chitthampalam A. Gardiner Mawatha, Colombo 02.

---

ලේකම්තුමා,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2024 පාර්ලිමේන්තු මැතිවරණය හා සම්බන්ධ රාජකාරි සඳහා පොලිස් නිලධරයන් යෙදවීම හේතුකොට ගෙන දින කිහිපයක් ගරු අධිකරණයන් හි සාක්ෂි දීම/ අනෙකුත් කටයුතු වෙනුවෙන් පොලිස් නිලධරයන් වෙත දින ලබා ගැනීම.

සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඡන්ද මධ්‍යස්ථාන 13314 ක් හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන 54 කට ආසන්න සංඛ්‍යාවක රාජකාරී සඳහා පොලිස් නිලධරයන් 2024.11.13 දින සිට 2024.11.15 දින දක්වා අනුයුක්ත කිරීමට නියමිතව ඇත.

එමෙන්ම, නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම උදෙසා පූර්ව මැතිවරණ ක්‍රියා, පශ්චාත් මැතිවරණ ක්‍රියා වැළැක්වීම සඳහා ද දිවයිනේ සමස්ත පොලිස් නිලධාරීන් අතරින් බහුතර පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවීමට මේ වන විට සැලසුම් සකස් කරමින් පවතියි.

එබැවින්, සමස්ත දිවයින පුරා පිහිටි ගරු අධිකරණ කටයුතු වලදී සාක්ෂි දීමට හා අනෙකුත් කටයුතු වෙනුවෙන් පොලිස් නිලධාරීන් වෙත ඉහත රාජකාරි හේතු කොටගෙන පැමිණීමට අවස්ථාවක් නොමැති හෙයින්, **2024.11.12 දින සිට 2024.11.14 දක්වා කාලය සඳහා එම නඩු කටයුතු ඉදිරි දින කිහිපයක් සඳහා කල් තැබීමට අවශ්‍ය කරන පරිදි අදාළ ගරු මහේස්ත්‍රාත්තුමන්ලා, විනිසුරුතුමන්ලා දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.**

නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම උදෙසා ඔබතුමාගෙන් ලැබෙන්නා වූ සහයෝගය ඉතා අගය කොට සලකමි.

අසංග කරවිට,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ප්‍රජා පොලිස්, සංචාරක,ආයෝජන හා මැතිවරණ.
PUBUDU

නීතිඥ අසංග කරවිට,
... D (Criminology), P.G.D (IR),
දිවුරුම් කොමසාරිස්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
ප්‍රජා පොලිස්, සංචාරක, ආයෝජන හා මැතිවරණ

පිටපත :- ගොනුවට.